VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 POLICE PARK PLACE, COLOMBO 05, SRI LANKA
TEL: + 94 112055544; FAX: +94 719379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

# ශ්‍රී ලංකාවේ ආර්ථික නිදහස, මෑත කාලීන වෙනස්කම් සහ එහි ප්‍රතිවිපාක

ඇමරිකාවේ හෙරිටේජ් පදනම විසින් (Heritage Foundation) විසින් ලෝක ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයක් (Global index of Economic Freedom) සකස් කරනු ලබයි. පශ්චාත් යුධ සමයේ මුල් වසර කිහිපය තුළ ශ්‍රී ලංකාව මෙම දර්ශකය තුළ යම් ප්‍රගතියක් පෙන්වීමට සමත් වුව ද 2014 වර්ෂයේදී යම්කිසි පසුබෑමකට ලක්වී ඇත. මෙම දර්ශකය තුළ යම්කිසි රටක ලකුණු මට්ටම සහ එහි ඇතිවන වෙනස්කම් වැදගත් වන්නේ එම ලකුණු මට්ටම සහ අනෙකුත් සමාජ ආර්ථික නිර්ණායක අතර පවතින සහසම්බන්ධය නිසාවෙනි.


ආර්ථික නිදහස පිළිබඳ දර්ශකය සකස් කිරීම සඳහා ප්‍රධාන කාණ්ඩ 04ක් යටතේ වර්ගීකරණය කොට අංශ 10 කට අයත් ප්‍රමාණාත්මක දර්ශක 10 ක් යොදා ගනු ලැබේ. එම ප්‍රධාන කාණ්ඩ 04 වන්නේ; **1)** නීතියේ ආධිපත්‍යය (දේපොල අයිතිය හා දූෂණයෙන් තොර බව), **2)** සීමිත රාජ්‍යය මැදිහත්වීම (බදු බර සහ ආර්ථිකය තුළ රජයේ කාර්යභාරය), **3)** නියාමනයේ කාර්යක්ෂමාතවය (ව්‍යාපාර සඳහා ඇති නිදහස, වැඩ කිරීමට ඇති නිදහස සහ මූල්‍ය පරිපාලනයේ නිදහස) සහ **4)** වෙළඳපොල පිළිබඳ නිදහස (වෙළඳාම පිළිබඳ නිදහස, ආයෝජන පිළිබඳ නිදහස හා මූල්‍ය නිදහස) යි.

මෙලෙස වර්ගීකරණය කොට ඇති කාණ්ඩ 10 න් සෑම කාණ්ඩයකටම උපරිමය ලෙස ලකුණු 100 ක් ලබාදෙනු ලැබේ. අනතුරුව දර්ශකය තුළ උපරිම ලකුණු සාමාන්‍යයක් ලබා ගන්නා රට ඉහළම ආර්ථික නිදහසක් සහිත රාජ්‍යය ලෙස ප්‍රථම ස්ථානය දිනා ගනී. මෙම දර්ශකය තුළ එක් එක් රාජ්‍යය ලබා ගන්නා ලකුණු සාමාන්‍යය අනුව ඔවුන් ප්‍රධාන කොටස් 5 කට වර්ගීකරණය කරනු ලැබේ (නිදහස්, බොහෝ දුරට නිදහස්, තරමක් දුරට නිදහස්, බොහෝ දුරට නිදහස් නැති හා මර්ධනකාරී).

## ආර්ථික නිදහස පිළිබඳ දර්ශකය තුළ ශ්‍රී ලංකාවේ කාර්ය සාධනය

මෙම දර්ශකය තුළ ශ්‍රී ලංකාව ඉහළම ලකුණු සාමාන්‍යයක් රඳවා ගැනීමට සමත් වූයේ 2001 වර්ෂයේදීය (ලකුණු 66 ක සාමාන්‍යයක්). එතැන් සිට මෙම ලකුණු සාමාන්‍යය ක්‍රමික අඩුවීමකට ලක් වූ අතර 2006 වන විට ආර්ථික නිදහස විශාල ලෙස අඩු මට්ටමට ළඟා වෙමින්, 2010 දී ලකුණු 55ක සාමාන්‍යයක් දක්වා පහත වැටුණි (රූප සටහන 01). යුද්ධයේ නිමාවත් සමග දර්ශකය තුළ යම්කිසි ප්‍රගතියක් වාර්තා කිරීමට සමත් වෙමින් 2013 දී 'තරමක ආර්ථික නිදහසක් ඇති' රාජ්‍යයක මට්ටමට ළඟා වීමට ශ්‍රී ලංකාව සමත් විය. නමුත් 2014 දී නැවත පසුබෑමකට ලක් විය.

**රූප සටහන 01 :** ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයෙහි සමස්ත ළකුණු මට්ටම - ශ්‍රී ලංකාව





මූලාශ්‍රය: ලෝක ආර්ථික නිදහස පිළිබඳ දර්ශකය - 2014, හෙරිටේජ් පදනම

**ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයේ විවිධ අංශ තුළ ශ්‍රී ලංකාවේ කාර්යසාධනය**

මේ ආකාරයට දර්ශකය තුළ ශ්‍රී ලංකාව ලබාගත් ළකුණු සාමාන්‍යයේ වෙනස්වීම සඳහා බලපෑ කරුණු පිළිබඳ විශ්ලේෂණය කිරීම මගින් එම කාල පරාසය තුළ ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සිදුවූ වෙනස්කම් පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය. 2001 සිට 2010 දක්වා කාල පරාසය තුළ ශ්‍රී ලංකාව ලබාගත් ළකුණු සාමාන්‍යය අඩුවීම සඳහා ආයෝජනය පිළිබඳ නිදහස, මූල්‍ය නිදහස, දේපොල පිළිබඳ අයිතිය හා නිදහස සහ දූෂණයෙන් තොර බව කාණ්ඩ තුළ ලබාගත් ළකුණු සංඛ්‍යාව අඩුවීම හේතු සාධක වී ඇත (රූප සටහන 02). 2010-2014 කාල පරාසය තුළ ශ්‍රී ලංකාව මෙම දර්ශකය තුළ යම්කිසි ප්‍රගතියක් වාර්තා කළ ද ඒ සඳහා 2001-2010 කාලය තුළ පසුබෑමකට ලක්වූ සියළුම අංශ වල ප්‍රගතිය හේතු සාධක වී නොමැත.

**ප්‍රගිතයක් වාර්තා කළ අංශ :** 2001-2014 කාල සීමාව තුළ ශ්‍රී ලංකාව ආයෝජනය පිළිබඳ නිදහස සම්බන්ධව ලබාගත් ළකුණු සංඛ්‍යාව 50 සිට 15 දක්වා පහත වැටුණි. මෙය 2014 වන විට ළකුණු 40 ක මට්ටම දක්වා ඉහළ නංවා ගැනීමට සමත් විය. අදාල කාල පරාසය තුළ මූල්‍ය නිදහස සම්බන්ධව ලබාගත් ලකුණු සංඛ්‍යාව ද 79 සිට 57 දක්වා පහත වැටුණ ද 2014 වන විට එය නැවත ළකුණු 68 ක් දක්වා ඉහළට ගෙන ඒමට සමත් විය.

**රූප සටහන 02 :** ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයෙහි ලකුණු මට්ටමේ වෙනස්වීම් - 2010 ට පෙර හා පසු කාල පරාසයන්




**ප්‍රගතියක් වාර්තා කිරීමට අසමත් වූ අංශ :** දේපොල පිළිබඳ නිදහස සම්බන්ධව ශ්‍රී ලංකාව 2001-2010 කාලය තුළ ලබාගත් ලකුණු මට්ටම 70 සිට 40 දක්වා පහත වැටුණු අතර 2014 දී එය 40 ක මට්ටමේ ම පසුවිය. දූෂණයෙන් තොර බව යන අංශය තුළ ලකුණු මට්ටම මෙම කාල පරාසය තුළ 50 සිට 32 දක්වා පහත වැටුණු අතර 2014 දී එය 33.4 ක් පමණ විය.


**ප්‍රගිතයක් වාර්තා කළ නව අංශ :** වෙළඳාම පිළිබඳ නිදහස සහ ෆිස්කල් නිදහස යන අංශයන් තුළ ශ්‍රී ලංකාව සාධනීය වර්ධනයක් වාර්තා කළ අතර එය සමස්ත දර්ශකය තුළ ශ්‍රී ලංකාවේ ලකුණු සාමාන්‍යය ඉහළට ගෙන ඒමට පිටුවහලක් සැපයීය. නමුත් 2013 සිට 2014 වන විට නැවත මෙම අංශ දෙකෙහි ලකුණු සංඛ්‍යාවන් ද යම්කිසි පසුබෑමකට ළක් විය. විශේෂයෙන් වෙළඳ නිදහස සම්බන්ධ පසුබෑම පිළිබඳව අප විසින් (වෙරිටේ රිසර්ච් ආයතනය) සිදුකරන ලද *'මිරිඟුවක් පසුපස හඹායන ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය'* යන විශ්ලේෂණය මගින් ඉදිරිපත් කරන ලදී. එහිදී ශ්‍රී ලංකාව විදේශ වෙළඳාම මත පනවා ඇති බදු අගයන් මෑත කාලය තුළ ක්‍රමික ඉහළ යාමකට ළක්වී ඇති බව පෙන්වා දෙන ලදී.

**ආර්ථික නිදහස මානව සංවර්ධනයට සම්බන්ධව වැදගත් වේ**

මෙම ආර්ථික නිදහස පිළිබඳ දර්ශකය ගැන අවධානය යොමු කිරීමේදී අවබෝධ කරගත යුතු ප්‍රධාන කරුණක් වන්නේ දර්ශකය තුළ ඉහළ ලකුණු සාමාන්‍යයක් පවත්වා ගැනීම තවත් කරුණු සමග ධනාත්මක සහසම්බන්ධයක් වන බවයි (රූප සටහන 03). උදාහරණයක් ලෙස 'නිදහස්' හා 'බොහෝ දුරට නිදහස්' ලෙස වර්ගීකරණය කොට ඇති රටවල් 'බොහෝ දුරට නිදහස් නැති' ලෙස වර්ගීකරණය කොට ඇති රටවලට සාපේක්ෂව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් දර්ශකය තුළ ඉහළ

ළකුණු මට්ටමක් රඳවා ගැනීමට සමත්ව ඇත (ශ්‍රී ලංකාව 'බොහෝ දුරට නිදහස් නැති' යන නිර්ණායකයට මායිම්ව මෙම දර්ශකය තුළ ළකුණු සාමාන්‍යයක් වාර්තා කොට ඇත). එමෙන්ම මෙම සහසම්බන්ධය ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයේ ළකුණු මට්ටම සහ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය අතර ද දක්නට ලැබේ.

**රූප සටහන 03:** ආර්ථික නිදහස සහ මානව සංවර්ධනය අතර සහසම්බන්ධය




මූලාශ්‍රය: ලෝක ආර්ථික නිදහස පිළිබඳ දර්ශකය - 2014, හෙරිටේජ් පදනම

ශ්‍රී ලංකාව මෙම දර්ශකය තුළ ලබාගත් ළකුණු සාමාන්‍යය ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය හා මානව හිමිකම් දර්ශකයේ ළකුණු මට්ටම සමග ගැලපෙන අතරම ශ්‍රී ලංකාව අනෙකුත් දකුණු ආසියාතික රටවලට සාපේක්ෂව දර්ශකය තුළ ඉහළ ළකුණු මට්ටමක් සහ තරාවක් (rank) රඳවා ගැනීමට සමත්ව ඇත. නමුත් ඉතා සීඝ්‍රයෙන් වෙනස් වන ආර්ථිකයන් ඇති ගිනිකොණ දිග ආසියාතික රටවල් හා සන්සන්දනයේදී මෙම දර්ශකය තුළ ශ්‍රී ලංකාවේ කාර්යසාධනය ඉතා අඩු මට්ටමක පවතී.

**දත්ත සටහන 01 :** ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයෙහි කාර්යසාධනය

| **ආර්ථික නිදහස පිළිබඳ දර්ශකය : වර්ගීකරණ රටවල්** | | | |
|---|---|---|---|
| **ලකුණු මට්ටම** | **නිර්ණායකය** | **රටවල් ගණන** | **උදාහරණ** |
| 80 ට වැඩි | නිදහස් | 6 | හොංකොං, සිංගප්පූරුව |
| 70 - 80 දක්වා | බොහෝ දුරට නිදහස් | 28 | ඇමරිකාව, දකුණු කොරියාව |
| 60 - 70 දක්වා | තරමක් දුරට නිදහස් | 56 | තායිලන්තය, මැලේසියාව |
| 50 – 60 දක්වා | බොහෝ දුරට නිදහස් නැති | 61 | ඉන්දුනීසියාව, කාම්බෝජය |
| 50 ට අඩු | මර්ධනකාරී | 27 | බුරුමය, සිම්බාබ්වේ |

**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**

**ඔබගේ අදහස් insights@veriteresearch.org වෙත විද්‍යුත් තැපැල් මාර්ගයෙන් යොමු කරන්න.**